ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2280/26 - 2022 මැයි මස 18 වැනි බදාදා - 2022.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

07 වන වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: ව/ප්‍රා.ලේ/1/3/4/2021/01.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම් පත්තුව සුළු කොට්ඨාසයේ, දික්ඕවිට ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක මු.පි.ගම්. 4302 හා 2022.04.21 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.1258 ක් පමණ වූ පහත සඳහන් විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 01**

ඉඩම් නම: මුතුරාජවෙල වත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි දෙකක් සහ මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජී. ඇල්. ඉරේෂා ශ්‍යාමලී, අංක 37/1, ජා.නි.ක්‍ර. හේකිත්ත, වත්තල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1258.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 ජූනි මස 27 වැනි දින පූ.භා. 10.00ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2022 ජූනි මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරයත්, වන්දි මුදල් හා එය ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

පී. ඩී. ටී. සී. රාජිකා,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2022 මැයි මස 17 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05 - 0084